(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක **53.** ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2025** මැයි **21** බදාදා **පූ.භා. 9.30** ට

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා,** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා

ගරු **කුමාර ජයකොඩි මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) දම්මික පටබැඳි මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ආනන්ද විජේපාල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා

ගරු **කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **වසන්ත සමරසිංහ මහතා,** වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හිනිදූම සුනිල් සෙනෙවි මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රත්න ගමගේ මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග ගුණසේකර මහතා,** තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා,** ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඇන්ටන් ජයකොඩි මහතා,** පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ආර්.එම්. ජයවර්ධන මහතා,** වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගමගෙදර දිසානායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත පියතිස්ස මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුන්දරලිංගම් ප්‍රදීප් මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුනීර් මුලාෆර් මහතා,** ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) හංසක විජේමුණි මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **උපාලි සමරසිංහ මහතා,** සමූපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. සරත් මහතා,** නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා,** කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා,** මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන් හේමචන්ද්‍ර මහතා,** විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **අජිත් අගලකඩ මහතා**

ගරු **අබූබකර් අතම්බාවා මහතා**

ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා

ගරු ජේ.සී. අලවතුවල මහතා

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය

ගරු බී. ආරියවංශ මහතා

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා

ගරු කේ. ඉලංකුමාරන් මහතා

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා

ගරු ඔෂානි උමංගා මහත්මිය

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු ක්‍රිෂ්නන් කලෙයිචෙල්වි මෙනෙවිය

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

ගරු උපුල් කිත්සිරි මහතා

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා

ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා

ගරු චමින්ද ලලිත් කුමාර මහතා

ගරු නීතිඥ සරත් කුමාර මහතා

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා

ගරු තිලංක යූ. ගමගේ මහතා

ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය

ගරු චතුර ගලප්පත්ති මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු අජිත් ගිහාන් මහතා

ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු අශෝක ගුණසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු ගයාන් ජනක මහතා

ගරු රුවන්තිලක ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය

ගරු ටී.කේ. ජයසුන්දර මහතා

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා

ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය

ගරු චන්දන තෙන්නකෝන් මහතා

ගරු ජීවන් තොන්ඩමන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු තනුර දිසානායක මහතා

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා

ගරු සුජීව දිසානායක මහතා

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු නන්දන පත්මකුමාර මහතා

ගරු නිමල් පලිහේන මහතා

ගරු නිශාන්ත පෙරේරා මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු නන්ද බණ්ඩාර මහතා

ගරු පද්මසිරි බණ්ඩාර මහතා

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් බලගල්ල මහතා

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු ඊ.එම්. බස්නායක මහතා

ගරු විජේසිරි බස්නායක මහතා

ගරු සුනිල් බියන්විල මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු ජගත් මනුවර්ණ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු චානක මාදුගොඩ මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

ගරු ධනුෂ්ක රංගනාත් මහතා

ගරු සංජීව රණසිංහ මහතා

ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා

ගරු සුනිල් රත්නසිරි මහතා

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා

ගරු මංජුල සුගත් රත්නායක මහතා

ගරු සුරංග රත්නායක මහතා

ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය

ගරු අසෝක සපුමල් රන්වල මහතා

ගරු තුරෛරාසා රවිකරන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු මනෝජ් රාජපක්ෂ මහතා

ගරු සුනිල් රාජපක්‍ෂ මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ආර්.ජී. විජේරත්න මහතා

ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු අතුල වෙළඳගොඩ මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

ගරු තිළිණ සමරකෝන් මහතා

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා

ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය

ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා

ගරු දේවානන්ද සුරවීර මහතා

ගරු චන්දන සූරියආරච්චි මහතා

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා**

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**

**ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා**

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**

**ගරු දිනේෂ් හේමන්ත මහතා**

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**

**ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා**

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**

**ගරු රියාස් ෆාරුක් මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"නියෝජිත පාර්ලිමේන්තු ක්‍රමය ක්‍රියාත්මක වන රටක මහජන නියෝජිතයෙකු ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ මූලික කාර්යභාරයන් අතර නියෝජනය, නීති සම්පාදනය, මහජන මුදල් පාලනය සහ අධීක්ෂණය ප්‍රධාන වන අතර එහිදී නියෝජනය යන ක්‍රියාවලිය මඟින් ඉටු කළ හැකි කාර්යභාරය ඉතා සුවිශේෂ වේ.

ඒ අනුව, මහජන නියෝජිතයෙකු ලෙස නියෝජනය යන කාර්යභාරය ඉටු කිරීමේදී මහජනතාව හා සම්බන්ධ පොදු කාරණා හා ප්‍රශ්න පිළිබඳව පාර්ලිමේන්තුවේ අවධානය යොමු කොට විධායකය හරහා විසඳුම් ලබා ගැනීමේ විවිධ ක්‍රමවේද පවතින අතර, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න, වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න, සභාව කල්තබන අවස්ථාවේ ප්‍රශ්න, සභාව කල්තබන අවස්ථාවේ යෝජනා මෙන්ම පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27(2)හි විධිවිධාන ප්‍රකාරව 'ප්‍රශ්න අවසානයේදී පොදු වැදගත්කමකින් යුතු කරුණක් සම්බන්ධයෙන් අදාළ අමාත්‍යවරයාට විධිමත් ලෙස දැනුම්දීමකින් අනතුරුව පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා හෝ පිළිගත් දේශපාලන පක්ෂයක නායකයෙකු විසින් අසනු ලබන ප්‍රශ්න' ඉන් ප්‍රධාන වේ.

ඒ අනුව, ස්ථාවර නියෝග 27(2)හි විධිවිධාන ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න සම්බන්ධව විවිධ අවස්ථාවලදී සභාවේ මතු වූ කරුණු සහ විශේෂයෙන්ම 2025.05.09 දින ඒ සම්බන්ධව මෙම සභාවේ ඇති වූ තත්ත්වය පිළිබඳව කථානායකවරයා වශයෙන් යම් පැහැදිලි කිරීමක් සිදු කිරීමටත්, ඒ සම්බන්ධව මාගේ තීරණය මෙම සභාවට දැනුම් දීමටත් කැමැත්තෙමි.

ස්ථාවර නියෝග 27(2) මඟින් සලසා ඇති විධිවිධාන ප්‍රකාරව විරුද්ධ පාර්ශ්වයේ නායකවරයාට සහ පක්ෂ නායකයින්ට සලසා ඇති මෙම අවස්ථාව මඟින් අපේක්ෂා කරනුයේ පොදු වැදගත්කමකින් යුත් නිශ්චිත කරුණක් පිළිබඳව, අදාළ විෂයභාර අමාත්‍යවරයාට කරනු ලබන කෙටි දැනුම්දීමක් මඟින් පිළිතුරු ලබාගැනීම වන අතර, ඒ අනුව අදාළ ප්‍රශ්නය ‘පොදු වැදගත්කමකින් යුතු කරුණක්’ වීම අත්‍යවශ්‍ය වන අතර, කෙටි දැනුම්දීමකින් පිළිතුරු සැපයීමට හැකිවන ආකාරයේ වීම ද ඉතා අත්‍යවශ්‍ය කරුණක් වේ.

එලෙසම, එවැනි ප්‍රශ්නයක අන්තර්ගතය එක් නිශ්චිත කරුණක් පාදක වන විෂයයකට සීමාවීම ද, එක් අමාත්‍යවරයෙකුගේ විෂය පථයට ගැනෙන කරුණක් විය යුතු වීමද මෙහිලා අත්‍යවශ්‍ය කරුණු ලෙස සැලකේ.

දීර්ඝ කාලයක සිට පැවත එන සම්ප්‍රදාය අනුව පෙරදින මධ්‍යාහ්න 12.00 ට ප්‍රථම අදාළ විෂයභාර අමාත්‍යවරයාට මෙකී ප්‍රශ්නය යොමු කිරීමේ අරමුණ වන්නේ ද ඉතා කඩිනමින් පිළිතුරු ලබාගැනීමට ඉඩකඩ සලසා ගැනීම වේ.

කෙසේ වුවද, දසවැනි පාර්ලිමේන්තුව ආරම්භයේ සිට මේ දක්වා මෙම විධිවිධානය යටතේ මතු කරනු ලබන බොහෝ ප්‍රශ්න ‘පොදු වැදගත්කමකින්’ යුත් කරුණු වලින් බැහැරව අනු ප්‍රශ්න රාශියකින් ද සමන්විත වීමත්, ඉතා විස්තරාත්මක දත්ත සහිතව පිළිතුරු අපේක්ෂා කිරීමත්, එක් අමාත්‍යවරයෙකුගේ විෂය පථයට සීමා නොවීමත්, එලෙසම සමාන ස්වරූපයේ ප්‍රශ්න නැවත නැවතත් දිගින් දිගටම ඉදිරිපත් කිරීමත් බොහෝවිට නිරීක්ෂණය වී තිබේ.

තවද, ස්ථාවර නියෝග ප්‍රකාරව මෙවැනි ප්‍රශ්න සඳහා අතුරු ප්‍රශ්න ඇසීමට ප්‍රතිපාදනයක් නොමැති වුවද, යම් කරුණු පැහැදිලි කිරීමක් ඉල්ලා සිටිමින් බොහෝවිට අතුරු ප්‍රශ්න ස්වරූපයෙන් ඒවා ඉදිරිපත් කිරීමත්, විශේෂයෙන් ප්‍රශ්නය යොමු කරනු ලැබූ පක්ෂ නායකවරයාට අමතරව වෙනත් මන්ත්‍රීවරයන්ද ඊට සම්බන්ධව කරුණු විමසීමට සහ ප්‍රශ්න ඇසීමට උත්සාහ කරනු ලබන අවස්ථාවන් මා විසින් වැඩිදුරටත් නිරීක්ෂණය කොට ඇති බව දන්වනු කැමැත්තෙමි.

තවද, මෙලෙස මතු කරනු ලබන බොහොමයක් ප්‍රශ්න වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න, වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න, සභාව කල්තබන අවස්ථාවේදී ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න සහ සභාව කල්තබන අවස්ථාවේදී ඉදිරිපත් කරනු ලබන යෝජනා මඟින් ඉදිරිපත් කිරීමට හැකියාව පවතින බවත් මෙහිලා වැඩිදුරටත් සඳහන් කිරීමට කැමැත්තෙමි.

පවත්නා මෙම තත්ත්වය හේතුවෙන් ප්‍රශ්නය මතු කිරීමට, පිළිතුරු ලබාදීමට සහ අතුරු ප්‍රශ්න මතු කිරීමට හා ඒවාට පිළිතුරු ලබාදීමට ඉතා විශාල කාලයක් ගතවීම හේතුවෙන් මේ සඳහා වෙන්කර ඇති කාලය තුළ එම කටයුතු නිම නොවීමෙන් සභාවේ දෛනික ප්‍රධාන වැඩ කටයුතුවලට දැඩි ලෙස බාධා පැමිණෙන බවත්, ප්‍රධාන වැඩකටයුතු වලට අදාළ කරීකයන්ගේ වේලාව අහිමි වන බවත් නිරන්තරයෙන් දක්නට ඇති තත්ත්වයකි.

ස්ථාවර නියෝග 27(2) යටතේ මතු කරනු ලබන මෙම ප්‍රශ්න සම්බන්ධව 2025.03.21 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී ද දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදුව, ස්ථාවර නියෝග විධිවිධාන, පවතින සම්ප්‍රදායන් සහ කථානායකවරයාගේ නියෝග මත පදනම්ව ආණ්ඩු පාර්ශ්වයේ සහ විරුද්ධ පාර්ශ්වයේ පොදු එකඟතාවය මත මේ සම්බන්ධ කටයුතු කරගෙන යාමට තීරණය කර තිබුණි.

කෙසේ වුවද, එකී විධිවිධානයන්ට සහ සම්ප්‍රදායන්ට අනුකූලව මෙකී ප්‍රශ්න ඉදිරිපත් නොකිරීම හේතුවෙන් කාල කළමනාකරණය සම්බන්ධ ගැටලු රාශියක් මතුව තිබෙන බැවින් මින් ඉදිරියට ස්ථාවර නියෝග 27(2) යටතේ මතු කරනු ලබන ප්‍රශ්න ඉහත විධිවිධානයන්ට අනුකූලව පමණක් ඉදිරිපත් කිරීමේ දැඩි අවශ්‍යතාවක් පවතින බව මෙම සභාවට අවධාරණය කිරීමට කැමැත්තෙමි.

එබැවින්, පවත්නා මෙම සියලු තත්ත්වයන් සැලකිල්ලට ගෙන මින් ඉදිරියට ස්ථාවර නියෝග 27(2) යටතේ මතු කරනු ලබන ප්‍රශ්න ඉහත විධිවිධානයන්ට අනුකූලව ඉදිරිපත් කරන ලෙස අදාළ පක්ෂ නායකවරුන්ගෙන් ඉල්ලා සිටින අතර, එම විධිවිධානයන්ගෙන් බැහැරව ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න සම්බන්ධව ස්ථාවර නියෝග ප්‍රකාරව අවශ්‍ය පරිදි කටයුතු කිරීමට මා හට සිදුවනු ඇති බවත් මෙම සභාවට වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව, මෙම ප්‍රශ්න යොමු කරනු ලබන සියලුම පක්ෂ නායකවරුන්ගේ අවධානයට මෙම කරුණු යොමු කරනු ලබන අතර, ස්ථාවර නියෝග ප්‍රකාරව සභාවේ කටයුතු කිසිදු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සම්බන්ධව ඔබගේ පූර්ණ සහයෝගය මම උදක්ම බලාපොරොත්තු වෙමි.”

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දසවැනි කාණ්ඩයේ —

(i) කිරි ගවයින් ආනයනය කිරීමේ ව්‍යාපෘතියේ තුන්වැනි අදියරෙහි II පියවර යටතේ කිරි ගවයින් 15000 ක් ආනයනය කිරීම සඳහා අත්තිකාරම් ලබාදීම පිළිබඳ විශේෂ විගණන වාර්තාව; සහ

(ii) 2024 ජනවාරි සිට අගෝස්තු දක්වා කාල පරිච්ඡේද තුළදී ජාතික තරුණ සේවා සභාව විසින් තාරුණ්‍ය පීඩාවෙන් මුදවා ගැනීම යන තේමාව යටතේ සිදු කරන ලද වැඩසටහන් 6 ක විධිමත්භාවය, ඵලදායිත්වය සභාවේ ප්‍රමුඛ අරමුණුවලට අනුකූලතාවය පිළිබඳව සිදුකරන ලද විශේෂ විගණන වාර්තාව

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අටවැනි කාණ්ඩයේ ‘අපි වෙනුවෙන් අපි’ අරමුදලේ කාර්ය සාධනය ඇගයීම සම්බන්ධ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(3) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් 2022 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කර, එම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් 2016, 2017, 2018, 2019 සහ 2020 වර්ෂ සඳහා සීමාසහිත ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කර, එම වාර්තා යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබල ගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් 2023/2024 වර්ෂය සඳහා සී/ස ලංකා පොස්පේට් සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) නාකියාදෙනිය, නාවල, කලිංගවත්ත යන ලිපිනයෙහි පදිංචි ඒ. කේ. සුනීතා මහත්මියගෙන් ලැබුණු 2025.02.26 දිනැති පෙත්සම;

(ii) බද්දේගම, බද්දේගම දකුණ, 'ජයසංඛ' යන ලිපිනයෙහි පදිංචි කේ. ජී. බන්දුපේම මහතාගෙන් ලැබුණු 2025.02.10 දිනැති පෙත්සම; සහ

(iii) බද්දේගම, මහහේන්ගොඩ, ගොඩ අරබ ගොඩ යන ලිපිනයෙහි පදිංචි එස්.කේ.ඩබ්. ජයසේකර මහතාගෙන් ලැබුණු 2025.02.10 දිනැති පෙත්සම

ගරු තිලංක යූ. ගමගේ මහතා විසින් පිළිගන්වන ලදී.

(2) කටුගස්තොට, හමංගොඩ පාර, නුගේගොඩවත්ත, අංක 5/1/C දරන ස්ථානයෙහි පදිංචි ආර්. එම්. විජේසුන්දර මහතාගෙන් ලැබුණු 2025.02.10 දිනැති පෙත්සම ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය විසින් පිළිගන්වන ලදී.

(3) කුරුණෑගල, ඉඳුල්ගොඩකන්ද යන ලිපිනයෙහි පදිංචි ඒ. ජී. එස්. අබේවර්ධන මහතාගෙන් ලැබුණු 2024.12.01 දිනැති පෙත්සම ගරු සුජීව දිසානායක මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) බණ්ඩාරගම, රඹුක්කන, අංක 83 දරන ස්ථානයෙහි පදිංචි එච්. ප්‍රියදර්ශනී කීර්තිසිංහ මෙනෙවියගෙන් ලැබුණු 2025.02.18 දිනැති පෙත්සම;

(ii) කළුතර දකුණ, කිතුලාව, අංක 622/02 දරන ස්ථානයෙහි පදිංචි එම්. ඩී. ධනපාල මහතාගෙන් ලැබුණු 2025.02.10 දිනැති පෙත්සම;

(iii) කළුතර, නාගොඩ, අරුණ මාවත, අංක 21/18 දරන ස්ථානයෙහි පදිංචි එම්. එෆ්. එස්. ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු 2025.02.12 දිනැති පෙත්සම; සහ

(iv) අළුබෝමුල්ල, අරුග්ගොඩ, රටියලාගොඩ, 'ලක්සිරි', අංක 422/ඒ දරන ස්ථානයෙහි පදිංචි ආර්. එච්. සිරියලතා මහත්මියගෙන් ලැබුණු 2025.01.27 දිනැති පෙත්සම

ගරු නන්දන පත්මකුමාර මහතා විසින් පිළිගන්වන ලදී.

(5) බණ්ඩාරවෙල, කිණිගම, හීල් ඔය පාර, 'ඉඳුනිල්', අංක 114/2, දරන ස්ථානයෙහි පදිංචි ඉඳුනිල් උමේෂ් දිසානායක මහතාගෙන් ලැබුණු 2025.01.23 දිනැති පෙත්සම ගරු සුදත් බලගල්ල මහතා විසින් පිළිගන්වන ලදී.

(6) (i) කෑගල්ල, දේවාලේගම, උරුලෑදෙණිය, කහපොලේවත්ත යන ලිපිනයෙහි පදිංචි එච්. පී. රාජපක්ෂ මහතාගෙන් ලැබුණු 2025.02.02 දිනැති පෙත්සම; සහ

(ii) අලව්ව, වෙරළුගොල්ලවත්ත, අංක ඩී/143 දරන ස්ථානයෙහි පදිංචි එන්. ඩී. කරුණාරත්න මහතාගෙන් ලැබුණු 2025.02.16 දිනැති පෙත්සම

ගරු මනෝජ් රාජපක්ෂ මහතා විසින් පිළිගන්වන ලදී.

(7) අම්බලන්ගොඩ, රංදොඹේ, කපුඇළ පාර, අංක 29 දරන ස්ථානයෙහි පදිංචි ජගමුනි චාමින්ද සංජීව මහතාගෙන් ලැබුණු 2024.12.03 දිනැති පෙත්සම ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. මුදල් පනත යටතේ නියෝගය:** අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය වෙනුවෙන් නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— 2003 අංක 25 දරන මුදල් පනතේ 2(1) වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 31 දිනැති අංක 2421/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.05.08 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(පූ.භා. 10.46ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

“ගරු අජිත් ගිහාන් මහතා මූලාසනාරූඪ විය යුතු ය”යි ගරු මුනීර් මුලාෆර් මහතා, ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.43ට ගරු අජිත් ගිහාන් මහතා මූලාසනාරූඪ විය.)

“ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය යුතු ය”යි ගරු සුනිල් රාජපක්ෂ මහතා, ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.01ට ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. මුදල් පනත යටතේ නිවේදනය:** අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය වෙනුවෙන් නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— 2018 අංක 35 දරන මුදල් පනතේ 51 වගන්තිය සමඟ කියවිය යුතු 19 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 31 දිනැති අංක 2421/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.05.08 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. කල් තැබීම:** “මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය” යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 5.03ට, මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් පාර්ලිමේන්තුව 2025 මැයි 22 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වනතෙක් කල් තබන ලදී.